පස්සර බස් අනතුරින් දෙමාපියන් මිය ගිය දරු තිදෙනාට රැකවරණ සැලසීමට වෛද්‍යවරයෙකු හා බිරිඳ ඉදිරිපත් වීම සම්බන්ධයෙන් සිළුමිණ පුවත්පතේ මෙන්ම ඉරිදා මව්බිම පුවත්පතේද ලිපි ඉදිරිපත් වී තිබිණි. මෙම පුවත්පත් දෙකේම අදාළ දරු තිදෙනාගේ ඡායාරූපද පළවී තිබිණි. කෙසේ නමුත් ඉරිදා මව්බිම ලිපියේ දැක්වුණු ඡායාරූපයේ දරු තිදෙනාගේ අනන්‍යතාවය හෙළි නොවන ආකාරයට කළු කොටු යොදා මුහුණේ වැඩි කොටසක් වසා තිබූ අතර, සිළුමිණ පුවත්පත කිසිදු අනන්‍යතාවය සැඟවීමකින් තොරව දරු තිදෙනාගේ ඡායාරූපය ඉදිරිපත් කර තිබිණි.

සිය පාසැල් අධ්‍යාපනය අනවශ්‍ය අතපෙවීම් වලින් තොරව සම්පූර්ණ කරගැනීමට බාලවයස්කරුවන් හට නිදහස තිබිය යුතු යැයි මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වේ. එයද පසුතල කරගනිමින් ගත් විට, දරු තිදෙනාගේ ඡායාරූපය අනන්‍යතාවය සැඟවීමකින් තොරව ඉදිරිපත් කිරීම සිළුමිණ ලිපියට අවශ්‍ය වේද? මෙම ලිපි දෙකම ඉදිරිපත් වී ඇත්තේ ධනාත්මක සන්දර්භයක වුවත්, එම දරුවන්ගේ අනන්‍යතාවය හෙළිදරවු කිරීම, ඔවුන්ගේ පාසැල් අධ්‍යාපනයට අහිසි ලෙසින් බල නොපානු ඇතැයි ඔබ සිතන්නේද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayMawbima #Silumina